තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය

# එච්. කේ. ආර්. එන්. ඉන්ද්‍රජිත් එ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/1149/2019 (2019.10.08 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතීඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී. ජී. එම්. වී. හපුආරච්චි

**අභියාචක** - එච්. කේ. ආර්. එන්. ඉන්ද්‍රජිත්
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරි, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය

**පෙනීසිටීම**
අභියාචක - එච්. කේ. ආර්. එන්. ඉන්ද්‍රජිත්
පොදු අධිකාරිය - පැමිණ නැත

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.09.03 |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2018.09.04 (තොරතුරු ඉල්ලීම ලැබුණු බව දැන්වීම) |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.10.02 |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2018.10.25 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.01.24 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු**:

අභියාචක 2018.09.03 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. *එච්. කේ. ආර්. එන්. ඉන්ද්‍රජිත් (විදුලි කාර්මික) විරුද්ධව 2017.05.30 දින සිට 2017.11.06 දින දක්වා පැවති විනය පරීක්ෂණ තීන්දුවේ පිටපත.*
2. *එච්. කේ. ආර්. එන්. ඉන්ද්‍රජිත් (විදුලි කාර්මික) විරුද්ධව 2017.12.31 දින සිට 2018.05.08 දින දක්වා පැවති විනය පරීක්ෂණ තීන්දුවේ පිටපත.*

තොරතුරු නිලධාරියා 2018.09.04 දින තොරතුරු ඉල්ලීම ලැබුණු බව දැන්වීම අභියාචකට දැනුම් දුන් නමුත්, පනත ප්‍රකාරව නියමිත කාලය තුළ, පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2018.10.02 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයා 2018.10.25 දිනැතිව ප්‍රතිචාර දක්වමින් පවසා සිටියේ ග්‍රෑන්ඩ් ඔරියෙන්ටල් හොටෙල් ආයතනය HOTELS COLOMBO (1963) LTD නමින් ලියාපදිංචි වී පවත්වාගෙන යන සම්පූර්ණයෙන්ම පෞද්ගලික ආයතනයක් බවත්, එබැවින් තම ආයතනය තොරතුරු දැනගැනීමේ පනතින් ආවරණය නොවන බැවින් එච්. කේ. ආර්. එන්. ඉන්ද්‍රජිත් මහතාගේ ලිපිගොනුව ලබා නොදිය හැකි බවය. මෙම තීරණයෙන් අභියාචක සැහීමකට පත් නොවූ හෙයින් 2019.01.24 දිනැතිව අභියාචක කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පොදු අධිකාරිය පැමිණ නැත.

පොදු අධිකාරිය විසින් තම ලිඛිත කරුණු දැක්වීමේදී සඳහන් කර සිටින්නේ තම ආයතනය තොරතුරු පනතේ 43 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියක් නොවන බවයි.

මෙහිදී කොමිෂන් සභාව නිරීක්ෂණය කර සිටිනුයේ මෙම පොදු අධිකාරිය 43 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියක් වන්නේද යන්න නිශ්චිව තහවුරු කර ගත යුතු බවයි. ඒ අනුව පොදු අධිකාරියේ (ග්‍රෑන්ඩ් ඔරියෙන්ටල් හොටෙල් ආයතනයේ), ලංකා බැංකුවට අයත් කොටස් වල ප්‍රතිශතය නිශ්තිෂ වශයෙන් තහවුරු කර ගැනීම සඳහා ලංකා බැංකුව තාවකාලික වශයෙන් මෙම අභියාචනයේ පාර්ශවකරුවෙකු ලෙස කැඳවීමට අවශ්‍ය බවයි.

**නියෝගය:**

ඒ අනුව පොදු අධිකාරිය වන ග්‍රෑන්ඩ් ඔරියෙන්ටල් හොටෙල් ආයතනයේ පොදු අධිකාරියක්ද යන්න තහවුරු කර ගැනීම සඳහා ලංකා බැංකුවට අයත් කොටස් වල ප්‍රතිශතය නිශ්චිත වශයෙන් තහවුරු කර ගැනීමට ලංකා බැංකුවට මීළඟ අභියාචනා දිනයේදී කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින මෙන් මින් නියෝග කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

අභියාචනය කල් තබන ලදී.
මීළඟ කැඳවීම් දිනය: 03.03.2020
*******